# ඉන්ටෙල් ජාත්‍යන්තර විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනය - ජාතික විද්‍යා පදනම් විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟ (SRPC) නියෝජනය ප්‍රථම වරට ජාත්‍යන්තර අධිසම්මාන ලබයි

ජාතික විද්‍යා පදනම විසින් 2008 වර්ෂයේ සිට සංවිධානය කරනු ලබන “විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟය” නියෝජනය කරමින් 2017 මැයි 14-17 දක්වා ඇමරිකාවේ ලොස්ඇන්ජලීස් නගරයේදී පවත්වන්නට යෙදුණු ඉන්ටෙල් ජාත්‍යන්තර විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනයට සහභාගි කෙරුණු විද්‍යා පර්යේෂණ ව්‍යාපෘතිය එහිදී අධිසම්මානයක් දිනා ගැනීමට සමත් වී තිබේ. මෙය, විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟ ඉතිහාසය තුළ ඉහත ජාත්‍යන්තර තරඟ යෙන් අධිසම්මානයක් ලද ප්‍රථම අවස්ථාව ලෙස ඉතිහාසයට එක්වේ.



ජයග්‍රහණයෙන් අනතුරුව සිය රටට ගොඩබට මොහොත

පසුගිය වසරේ (2016) ජාතික විද්‍යා පදනම මගින් සංවිධානය කෙරුණු විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟය නියෝජනය කරන ලද දෙහිවල, එස්. ද එස්. ජයසිංහ මධ්‍ය මහා විද්‍යාලයේ සිසුන් දෙදෙනෙකු වූ ෂෙහාන් කවිශ්ක සහ සංකල්ප පෙරේරා 2017 මැයි 19 දින ලොස්ඇන්ජලීස් නගරයේදී පවත්වන ලද ඉන්ටෙල් ජාත්‍යන්තර විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනයෙහි අධිසම්මාන උළෙලේදී “මිහිකත සහ පරිසරය” නැමති කාණ්ඩය යටතේ මෙලෙස අධිසම්මානයකින් (සිව්වන ස්ථානය) පිදුම් ලැබ ඇත. මෙම ජයග්‍රාහී විද්‍යා පර්යේෂණ ව්‍යාපෘතියෙහි මාතෘකාව වූයේ “අපජලය පිරිපහදුවට නිනිති තාක්ෂණය (නැනෝ තාක්ෂණය) යොදාගෙන විෂ සහිත ක්‍රෝමියම් vi ඉවත් කිරීම සඳහා චුම්භකත්ව ගුණ සහිත ජෛව අඟුරු සංයුක්තය නිර්මාණය කිරීම” ය.

අධිසම්මාන උත්සවයට පෙර දින, එනම්, 2017 මැයි 18 වන දින පවත්වන ලද විශේෂ සම්මාන උළෙලේදී මෙම සිසුන් දෙදෙනාගේ විද්‍යා පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 1,000/-ක විශේෂ සම්මානයක්, එනම්, “මොහීබාගේ විශේෂ සම්මානය” ද හිමි විය.

ජාතික විද්‍යා පදනම් විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති මගින් දිනා ගන්නා ලද ජාත්‍යන්තර සම්මාන පිළිබඳව සලකන විට ප්‍රථම ජාත්‍යන්තර සම්මානය 2016දී ඇමරිකාවේ ඇරිසෝනා ප්‍රාන්තයේ ෆීනික්ස්හි පවත්වන ලද ඉන්ටෙල් ජාත්‍යන්තර විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනයට සහභාගි වූ හලාවත, ඩී.එස්. සේනානායක ජාතික පාසලේ පී. එම්. ලෝචන පියුමන්ත ප්‍රනාන්දු ශිෂ්‍යයා විසින් ඉදිරිපත් කරන ලද කේවල විද්‍යා පර්යේෂණ ව්‍යාපෘතියට හිමිවූ ඇ.එ.ජ. ඩොලර් 1,000/-ක විශේෂ සම්මානය සඳහන් කළ හැකිය. එම විශේෂ සම්මානය ඔහුට හිමිවූයේ ඔහු විසින් ඉදිරිපත් කරන ලද “ගර්භාෂයික ශ්ලේෂ්මල පටක පිළිකා සෛල (AN3CA) මත එලැජික් අම්ලයෙන් කාර්යබද්ධ කරන ලද අයන් ඔක්සයිඩ් නැනෝ අංශුවල ප්‍රති ප්‍රගුණන සහ සෛල නාශක බලපෑම්” නම්වූ විද්‍යා පර්යේෂණ ව්‍යාපෘතියටය.

ෂෙහාන් කවිශ්ක සහ සංකල්ප පෙරේරා 2017 ජනවාරි 17-19 දක්වා කොළඹදී පවත්වන ලද විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟය - 2016 සඳහා ඉදිරිපත් වූ අතර ඔවුන්ගේ විද්‍යා පර්යේෂණ ව්‍යාපෘතිය (අපජලය පිරිපහදුවට නිනිති තාක්ෂණය යොදාගෙන විෂ සහිත ක්‍රෝමියම් vi ඉවත් කිරීම සඳහා චුම්භකත්ව ගුණ සහිත ජෛව අඟුරු සංයුක්තය නිර්මාණය කිරීම) එම තරඟයේ ජයග්‍රාහී ව්‍යාපෘති දහය අතරට තෝරාගන්නා ලදී. එමගින් ඔවුන් හට තම ව්‍යාපෘතිය 2017 පෙබරවාරි 09 වන දින කොළඹ දී පවත්වන ලද ශ්‍රී ලංකා විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනයට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබුණි. එම තරඟයෙන් දෙවන ස්ථානය ලබා ගැනීමට ඔවුන් සමත් වූ අතර ලොස්ඇන්ජලීස් නගරයේදී පවත්වන ලද ඉන්ටෙල් ජාත්‍යන්තර විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීමේ වරම එමගින් ඔවුන්ට හිමි විය.




ජයග්‍රහණයේ පදක්කම්

ජාත්‍යන්තර ජයග්‍රහණ ඉහළ නංවා ගැනීමේ අරමුණ සහිතව මෑතභාගයේදී ජාතික විද්‍යා පදනමේ සභාපතිතුමිය සහ විද්‍යාව ප්‍රචලිතකිරීමේ ක්‍රියාකාරී කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ මත ජාතික විද්‍යා පදනම මගින් ප්‍රගතිශීලී පියවර කිහිපයක් හඳුන්වා දීම ඔස්සේ විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟය විශාල වශයෙන් වැඩිදියුණු කරන ලදී. මෙහිදී කැපීපෙනෙන පියවරක් වූයේ පර්යේෂණ ක්ෂේත්‍රයෙහි සක්‍රීයව නියැලෙන විද්‍යාඥයින් මෙම විද්‍යා













**ගරු සුසිල් ප්‍රේමජයන්ත අමාත්‍යතුමාගෙන් පිළිවෙලින් 1. සංකල්ප 2. ෂෙහාන් 3. ගයනි සමරසිංහ මහත්මිය සහ 4. ආචාර්ය මෙත්තිකා විතානගේ ත්‍යාග ලබා ගැනීම.**

පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා ප්‍රධාන අධීක්ෂකවරු හඳුන්වා දීමයි. ජාත්‍යන්තර ජයග්‍රහණය ලැබූ අපජලයේ ක්‍රෝමියම් ඉවත්කිරීම පිළිබඳව වූ විද්‍යා ව්‍යාපෘතිය සඳහා ප්‍රධාන අධීක්ෂකවරිය ලෙස ජාතික මූලික අධ්‍යයන ආයතනයෙහි සේවය කළ ආචාර්ය මෙත්තිකා විතානගේ ජාතික විද්‍යා පදනම මගින් හඳුන්වා දෙනු ලැබීම සිදු කෙරුණි. ඇය මෙම සිසුන් දෙදෙනා ජයග්‍රාහී මාවතට යොමුකරවීම සඳහා විශිෂ්ට කාර්යභාරයක් ඉටු කළාය.

මෙම පියවරට අමතරව, තරඟය පවත්වාගෙන යන අතරතුර කාලයේදී විද්‍යා පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා වැඩමුළු දෙකක් පැවැත්වීම, ඒ සඳහා පර්යේෂණ ක්ෂේත්‍රයේ පළපුරුදු විද්‍යාඥයන්ගේ සේවය ලබා ගැනීම, මෙම තරඟය සඳහා ඉදිරිපත් කෙරෙන විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති උදෙසා ලබාදෙනු ලබන මූල්‍යමය ආධාර (රු. 50,000/- දක්වා) ඉහළ නැංවීම, මෙම තරඟය වැඩිදියුණු කිරීම සඳහා ජාතික විද්‍යා පදනම මගින් යොදා ගනු ලැබූ අනෙකුත් පියවර ලෙස හඳුන්වා දිය හැකිය.

ජාත්‍යන්තර විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනයෙන් ජයග්‍රහණය කරන ජාත්‍යන්තර අධිසම්මානලාභීන්ගේ සංඛ්‍යාව ඉහළ නැංවීමටත්, ශ්‍රී ලාංකීය පාසල් ශිෂ්‍ය ප්‍රජාව විද්‍යාත්මක පර්යේෂණවල නියැලීම දිරිමත් කිරීමටත්, එමගින් අප රටේ පාසල් ප්‍රජාව තුළ විද්‍යා පර්යේෂණ සංස්කෘතියක් බිහිකිරීමටත් ජාතික විද්‍යා පදනම අදිටන් කොට ගෙන තිබේ.

ජාත්‍යන්තරය ජයගත් මෙම ජයග්‍රාහකයින් ජාතික වශයෙන් ඇගයීමේ වැඩසටහනක් ජාතික විද්‍යා පදනම මගින් සංවිධානය කරන ලදී. මෙහිදී ගරු විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමන්ගේ සුරතින් ජයග්‍රාහී සිසුන්ට ලැප්ටොප් පරිගණක ද ජයග්‍රාහී විද්‍යා ව්‍යාපෘතිය භාරව කටයුතු කළ එස්. ද එස්. ජයසිංහ මධ්‍ය විද්‍යාලයේ ගයනි සමරසිංහ ගුරුතුමියට සහ එකී ව්‍යාපෘතියෙහි ප්‍රධාන අධීක්ෂකවරිය ලෙස කටයුතු කළ ජාතික මූලික අධ්‍යයන ආයතනයෙහි ආචාර්ය මෙත්තිකා විතානගේ මහත්මියට මුදල් ත්‍යාග ද පිරිනැමීම සිදු කෙරුණි.

එමෙන්ම, විවිධ ජනමාධ්‍ය ආයතනවලට ෂෙහාන් සහ සංකල්ප යොමු කරවීම මගින් ඔවුන්ගේ ජයග්‍රහණය පිළිබඳ තොරතුරු මහජනතාව වෙත ගෙනයෑමට ද කටයුතු කරන ලදී.

ලොව විශාලතම ජාත්‍යන්තර විද්‍යා තරඟය වන ඉන්ටෙල් ජාත්‍යන්තර විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනයට සහභාගිවූ රටවල් 78ක් නියෝජනය කරමින්, අනුබද්ධ තරඟ 425කින් පැමිණි 1800කට අධික තරුණ විද්‍යාඥයන් අතරින් අධිසම්මාන දිනාගැනීමට සමත්කම් දැක්වූ ෂෙහාන් කවිශ්ක සහ සංකල්ප පෙරේරා යන සිසු දරුවන් දෙදෙනාට ජාතික විද්‍යා පදනම, තම උණුසුම් සුබපැතුම් පිරිනමයි !

**කේ. ජී. ජනක කරුණාසේන**
අතිරේක අධ්‍යක්ෂ (ආවරණ)

